# මතුගම අධ්‍යාපන කලාපය

## විද්‍යා විෂය ඒකක සංවර්ධන වැඩසටහන

| 8 ශ්‍රේණිය | ධ්වනිය | ඒකකය - 05 |
|---|---|---|

## A කොටස

- **සුදුසු පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න**

1). සරසුලක සංඛ්‍යාතය කෙරෙහි බලපාන සාධකය,

i. සරසුල සාදා ඇති ලෝහය ii. සරසුලක බාහුවේ දිග
iii. සරසුලෙහි ඝනකම iv. තන්තුවල දිග

2). බටනලාවක කම්පනය වන වායු (වාත) කඳේ දිග අඩුවන විට,

i. සංඛ්‍යාතය වැඩි වේ ii. සංඛ්‍යාතය අඩු වේ
iii. ඝෝෂාකාරී ශබ්දයක් ඇති වේ iv. වෙනසක් සිදු නොවේ

3). මිනිස් කනට ශ්‍රවණය කළ හැකි ධ්වනියේ ශ්‍රව්‍යතා සීමාව හර්ට්ස්,

i. 20 - 2000 ii. 20 - 200 iii. 20 - 25000 iv.20 - 20000

4). පහත සඳහන් උපකරණ අතුරින් සම්ප්‍රදායික සංගීත භාණ්ඩයක් ලෙස සැලකිය හැක්කේ,

i. වයලීනය ii. ඕගනය iii. ගිටාරය iv. හොරණෑව

5). බටනලාවක කම්පනය වන වාත කඳේ දිග වෙනස් කිරීම සිදු කරන්නේ,

i. කටින් පිඹීම සිදු කරමින්
ii. ඇඟිලි තුඩුවලින් කවුළු ඇරීම මගින්
iii. ඇඟිලි තුඩුවලින් කවුළු වැසීම මගින්
iv. ඇඟිලි තුඩුවලින් කවුළු වැසීම හා ඇරීම සිදු කරමින්

(ල. 10)

- පහත සඳහන් වගන්ති නිවැරදි නම් (✓) ලකුණ ද වැරදි නම් (×) ලකුණ ද වරහන් තුළ යොදන්න.

6). ධ්වනිය හෙවත් ශබ්ද නිපදවන උපකරණ ධ්වනි ප්‍රභව ලෙස හඳුන්වයි. ( )

7). කුරුල්ලන්ගේ කිචිබිචි නාදය කෘත්‍රිම නාදයක් ලෙස සැලකේ. ( )

8). සයිලපෝනය පටල කම්පනය වීමෙන් හඬ උපදවන සංගීත භාණ්ඩයකි. ( )

9). බල්ලාට 20 $H_z$ ට අඩු සංඛ්‍යාත සහිත ශබ්ද ඇසේ. ( )

10). ධ්වනිය උත්පාදනය වීමේ දී කම්පනය වන කොටස අනුව සංගීත භාණ්ඩ වර්ග තුනකි. ( )

(ල. 10)

## B කොටස - රචනා

- **සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

(1).

ධ්වනි ප්‍රභව

| (i) ......................... කම්පනය වන | වා කඳන් කම්පනය වන | (i) ......................... කම්පනය වන |
|---|---|---|
| උදා - (iii) .......................... | උදා - (iv) .......................... | උදා - (v) .......................... |
| .......................... | .......................... | ගිටාරය |

(ල. 08)

(2). (i). මී මැස්සන් ගුමු ගුමු නාදය ඇති කරන්නේ කෙසේ ද? (ල. 02)

(ii). පළඟැටියන්/රෑහැයියන් ගේ ශබ්දය ඇතිවන අන්දම සඳහන් කරන්න. (ල. 02)

(3). (i). මිහිරි ශබ්දයක් (ii). අමිහිරි ශබ්දයක් ඇතිවන ආකාරය කෙටියෙන් පහදන්න. (ල. 04)

(4). ජීවයේ ගුණාත්මක බව වර්ධනය සඳහා සංගීතය යොදා ගත හැකි අවස්ථා තුනක් සඳහන් කරන්න. (ල. 03)

(5). සංඛ්‍යාතය මනින අන්තර් ජාතික ඒකකය කුමක් ද? (ල. 02)

(6). පරිසරයේ ඝෝෂා ඇතිවන අවස්ථා 3 ක් සඳහන් කරන්න. (ල. 03)

National e-learning Portal for The General Education

(7). පහත රූපයේ දැක්වෙන්නේ සිසුවෙකු සයිලපෝනයක් වාදනය කරන ආකාරයයි.



(i). මෙම භාණ්ඩය වාදනය සඳහා භාවිතා කරන උපකරණය (ස්ටික් එක) තැනීමේ දී භාවිතයට ගන්නා ද්‍රව්‍ය 2 ක් සඳහන් කරන්න. (ල. 02)

(ii). ඉහළ සංඛ්‍යාත අගයක් ලබා ගැනීමට කම්පනය කළ යුත්තේ කුමන තහඩු ද? (ල. 02)

(iii). දඬු තහඩු කම්පනය වීමෙන් හඬ උපදවන වෙනත් උපකරණ 2 ක් නම් කරන්න. (ල. 02)